# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 77 දරන ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය පනත

---

**[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 18 වන දින.]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1988 අංක 77 දරන ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 18 වන දින]

ඇල්. ඩී.—ඕ. 88/88

"ජේ. ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය" යන නමින් හැඳින්වෙන ලේඛන ගබඩාගාරයක් පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 77 දරන ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (1) (මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජේ. ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර සහ පුස්තකාල මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලබන ගබඩාගාරයක් පිහිටුවනු ලැබිය යුතු ය. **ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීම.**

(2) මේ මධ්‍යස්ථානය, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඇන්. සම්බන්දන් විසින් සහතික කරන ලද 1938 පෙබරවාරි මස 8 වන දිනැති අංක 5761 දරන ඔප්පුව මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් මහජන චීන සමූහාණ්ඩුවෙන් මිලයට ගන්නා ලද්දා වූ ද කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නාගරිකය ඇතුළත (අංක 36) කුරුඳුවත්ත කොට්ඨාශයෙහි (දැන් ධර්මපාල මාවත යනුවෙන් හඳුන්වනු ලබන) ධරව් පෑරේ පිහිටි ධර්මපාල මාවතේ වරිපනම් අංක 191/1-5, 1/1 සහ 1/2 දරන්නාවූද ස්ථානයෙහි පිහිටුවනු ලැබිය යුතු ය.

(3) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි, මධ්‍යස්ථානය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස මහා භාරකාර වරයා භාරයේ තිබෙන්නා වූ සියලු මුදල්, මේ පනත ආරම්භ වන දිනයෙහි සිට 9 වන වගන්තිය මගින් පිහිටුවනු ලබන අරමුදලට පැවරෙන අතර, ඒවා මධ්‍යස්ථානය නඩත්තු කිරීම සහ එහි පහසුකම් නංවාලීම පිණිස ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය.

(4) මේ මධ්‍යස්ථානය (1) වන උපවගන්තියෙන් ඊට වෙන් කර දී ඇති නාමයෙන් යුක්ත සංස්ථාවක් වන අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. එම නමින් මධ්‍යස්ථානය විසින් නඩු පැවරීම ද මධ්‍යස්ථානයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. (1) මධ්‍යස්ථානයේ පරිපාලනය, කළමනාකරණය හා පාලනය මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි සංයුක්ත වන පාලක මණ්ඩලයක් වෙත පැවරෙන්නේ ය. **මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය.**

(2) මධ්‍යස්ථානයේ පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ වියදම්, ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුවේ වැය ප්‍රතිපාදන යටතේ වාර්ෂිකව සැලසිය යුතු වැය ප්‍රතිපාදන මගින් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

(3) මධ්‍යස්ථානයේ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු ය:—

(අ) ජනරජයේ ජනාධිපතිවරයා;

(ආ) ජීවත්ව සිටින සියලු ආදි ජනාධිපතිවරු;

(ඇ) අග්‍රාමාත්‍යවරයා;

(ඈ) කථානායකවරයා;

(ඉ) විරුද්ධ පක්ෂයේ නායකවරයා;

(ඊ) ජනාධිපති ලේකම්වරයා;

(උ) මහා භාරකාරවරයා;

(ඌ) ජාතික ලේඛනාගාරයේ අධ්‍යක්ෂවරයා; සහ

(එ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙක්: මේ දෙදෙනාගෙන් එක් එක් තැනැත්තා, ජනාධිපතිවරයා විසින් ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලබන පත්වීමේ ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමා තුළ (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ධුරය දැරිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ (එ) ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයකුගේ පත්වීම, ජනාධිපතිවරයා විසින් ස්වකීය පරම අභිමතය පරිදි, ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(5) (3) වන උපවගන්තියේ (එ) ඡේදය යටතේ පත් කරන ලද මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ජනාධිපතිවරයා අමතා ස්වකීය අත්සන සහිතව යවනු ලබන ලිපියක් මගින්, කවර හෝ වේලාවක මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධ සහ එම රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධ මණ්ඩලයේ කාර්ය පරිපාටිය මණ්ඩලය විසින් විධිමත් කර ගත හැකි ය.

(7) සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ මණ්ඩලයේ සාමාජිකයකුගේ පත්වීමෙහි යම් දෝෂයක් තිබීමේ හේතුවෙන්ම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය.

(8) ජනාධිපතිවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

4\. (1) මධ්‍යස්ථානයේ නමින් පහත දැක්වෙන කාර්ය ඉටු කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය :— මණ්ඩලයේ බලතල.

(අ) ඡන්දයෙන් තෝරා පත් කර ගත් ප්‍රථම ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් වහන්සේගේ 1978—88 ධුරකාලය ඉකුත්වීමෙන් පසු, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාගාර පනතේ 9අ වන වගන්තිය යටතේ ජාතික ලේඛනාගාරයට පවරනු ලබන සියලු රාජ්‍ය වාර්තා සහ මුද්‍රිත ද්‍රව්‍ය තබාගැනීම ;

(ආ) පොත්පත්, ලියකියවිලි, ලිපිගොනු, ඡායාරූප, චිත්‍රපට සහ තැටි, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ටේප් පටි, පවුලේ පාරම්පරික වස්තු, එකී ජේ. ආර්. ජයවර්ධනගේ ළමාවිය හා තරුණ විය පිළිබඳ සිහිවටන, ඔහු විසින් පෞද්ගලික ලැදියාවෙන් නිර්මාණය කරන ලද සහ එකතු කරන ලද දේ, මැතිවරණ ව්‍යාපාරවලට අදාළ සිහිවටන, තිල චිත්‍ර, සහ ඔහුට ලැබුණු ප්‍රදාන, පදක්කම් සහ ත්‍යාග තැන්පත් කර තැබීම සඳහා පිළිගැනීම ;

(ඇ) දේශපාලන පක්ෂ හිතවතුන්, පවුලේ සහ පුද්ගලික මිත්‍රයන් හා වෙනත් අය විසින් ත්‍යාග කරන ලද්දා වූ ද එකී ජේ. ආර්. ජයවර්ධනට අදාළ වූ ද ද්‍රව්‍ය තැන්පත් කර තැබීම සඳහා පිළිගැනීම ;

(ඈ) (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් ද්‍රව්‍ය ආරක්ෂා කිරීමට හා සංරක්ෂණය කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීම ;

(ඉ) එම ද්‍රව්‍ය සම්බන්ධයෙන් පරිපාලන සේවාවක් සැපයීම ;

(ඊ) එම ද්‍රව්‍ය ප්‍රදර්ශනය කිරීම ;

(උ) විද්වත් රැස්වීම් පැවැත්වීම ;

(ඌ) වාචිකව සටහන් කර ඇති ඓතිහාසික කරුණු පිළිබඳ වැඩ සටහන් පැවැත්වීම ;

(එ) මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ, ක්‍රියාත්මක කිරීමේ, ආරක්ෂා කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා මුදලින් හෝ වෙනත් දේපළවලින් කෙරෙන ප්‍රදාන, ත්‍යාග සහ රික්ථවරණ ඉල්ලා සිටීම සහ භාරගැනීම ;

(ඒ) නිශ්චල හෝ චංචල දේපළ, අත්කරගැනීම, දැරීම හෝ කළමනාකරණය කිරීම ;

(ඔ) (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් දේපළ හැර, මණ්ඩලයට හිමිවන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළ විකිණීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීම හෝ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම ;

(ඕ) මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට සහ එකඟවීම්වලට ඇතුළත්වීම හා ඒවා ඉටුකිරීම ;

(ඝ) මේ පනතේ විධිවිධාන එලගැන්වීම සඳහා අවශ්‍ය වන සියලු ක්‍රියා හෝ දේ ඉටුකිරීම.

(2) (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් ද්‍රව්‍ය සම්බන්ධයෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාගාර පනතේ 9අ වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කිසිවක්, අදාළ නොවිය යුතු ය.

මධ්‍යස්ථානයේ මුදල් ආයෝජනය කිරීම.

5. මධ්‍යස්ථානයට අයිති යම් මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට මණ්ඩලය විසින් ආයෝජනය කළ හැකි ය.

මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය.

6. පහත සඳහන් ක්‍රියා කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය :

(අ) මධ්‍යස්ථානයේ ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි මධ්‍යස්ථානයේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීම ; සහ

(ආ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය තීරණය කිරීම.

විගණනය.

7. (1) මධ්‍යස්ථානයේ ආදායම හා වියදම පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) මධ්‍යස්ථානයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ විය යුතුය.

වාර්ෂික වාර්තාව.

8. එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයට පසුව හැකි තරම් ඉක්මණින්, මණ්ඩලය විසින් එම වර්ෂය තුළ මධ්‍යස්ථානයේ කටයුතු පරිපාලනය පිළිබඳ වාර්තාවක් සහ මධ්‍යස්ථානයේ ආදයම සහ වියදම පිළිබඳව සහ එම වර්ෂය තුළ දී මධ්‍යස්ථානයට අයිති මුදල් ආයෝජනය කිරීම පිළිබඳව ප්‍රකාශයක් පිළියෙල කළ යුතු ය. මණ්ඩලය විසින් එම වාර්තාව සහ ප්‍රකාශය අමාත්‍යවරයාට යැවිය යුතු අතර අමාත්‍යවරයා විසින් ඒවා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට සැලැස්විය යුතු ය.

මධ්‍යස්ථානයේ අරමුදල.

9. (1) මධ්‍යස්ථානයට මධ්‍යස්ථානයේම අරමුදලක් තිබිය යුතු ය.

(2) එම අරමුදලට—

(අ) මධ්‍යස්ථානයේ කාර්ය සඳහා වාර්ෂිකව නියම කරනු ලබන සියලු මුදල් ප්‍රමාණ ;

(ආ) ප්‍රධාන වශයෙන් ඊට ලැබෙන සියලු මුදල් ප්‍රමාණ ;

(ඇ) මධ්‍යස්ථානය විසින් කරනු ලබන ආයෝජන වලින් ආදායම් ලෙස ලැබෙන සියලු මුදල් ප්‍රමාණ ; සහ

(ඈ) 2 (3) වන වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් අරමුදල වෙත පැවරෙන සියලු මුදල් ප්‍රමාණ

ගෙවනු ලැබිය යුතු ය.

(3) මධ්‍යස්ථානයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී මධ්‍යස්ථානය විසින් දරන ලද යම් වියදම් පියවීමට අවශ්‍ය සියළු මුදල් ප්‍රමාණ අරමුදලින් ගෙවිය යුතු ය.

**10.** මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ යුතුකම් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කාරණයක් සම්බන්ධයෙන් අවශ්‍ය යයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන රීති මණ්ඩලය විසින් සෑදිය හැකිය. රීති.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.